## ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - 2014

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2015 ජූලි 08 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 ට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම සඳහා වූ තථ්‍ය මුදල් ගලායාම රු. 262,614,397 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි රු. 252,627,757 ක් ලෙස දක්වා තිබුණි

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විශ්වවිද්‍යාලයේ ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය උපචිත පදනම වුවත් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු. 59,252,600 ක් සහ ගෙවූ රු. 47,786,600 ක් වූ මහපොළ හා ශිෂ්‍යාධාර ඊට පටහැනිව මුදල් පදනම් මත ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු. 24,695,682 ක් වටිනා වෙනත් උපකරණ මිලදීගෙන තිබුණු අතර වර්ෂයේ ක්ෂය ගණනය කිරීම සඳහා එම ප්‍රමාණය පාදක කර නොගැනීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු. 4,939,136 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන මත ක්ෂය ප්‍රමාණය රු. 206,932,538 ක් වූ නමුත් විලම්භිත ආදායම් ලෙස ක්‍රමක්ෂය කළ ප්‍රමාණය රු. 206,569,272 විය. මේ පරිදි දිගින් දිගටම ඇතිවූ ගිණුම්කරණ දෝෂ හේතුවෙන් වර්ෂ අවසානයට රාජ්‍ය ප්‍රදාන වටිනාකම රු.2,263,300,000 ක් වුවද එය නියෝජනය වූ ශුද්ධ වත්කම්වල වටිනාකම රු.2,069,087,715 ක් විය.

(ඇ) නිලධාරින් 07දෙනෙකු විසින් ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් අදාල පාර්ශවයන් විසින් ගෙවීමට එකඟ වූ දැනටමත් අයවෙමින් පවතින ශේෂයන්ගෙන් තවදුරටත් අයවිය යුතු රු.41,109,618ක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ලැබිය යුතු මුදලක් ලෙස දක්වා නොතිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 09 දින පැවති උපාධි ප්‍රදානෝත්සවය වෙනුවෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාව වෙත ගෙවිය යුතු මුදලට වඩා වැඩිපුර ගෙවා තිබූ රු.235,719 ක් අයකර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත ක්ෂය වෙන්කිරීම් වෙනුවෙන් කරනු ලැබූ රු.48,214,484 ක් වූ හර සටහන් හා රු.11,272,298 ක් වූ බැර සටහන්හි ක්ෂය ගැලපීම්වලට අදාළ කාල පරිච්ඡේද හා හේතූන් සම්බන්ධව විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිණි.

**2.2.5 නොසැසඳුණු පාලන ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ක්ෂය ගණනය සඳහා භාවිතා කරනු ලබන උපලේඛනයෙහි සඳහන් ජංගම නොවන වත්කම් හි වාර්ෂික එකතු කිරීම් හා 2005 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනයන් හි වත්කම් එකතු කිරීම් පරීක්ෂා කිරීමේ දී ජංගම නොවන වත්කම් 04 ක රු.862,091,260 ක වෙනසක් වූ හෙයින් වත්කම්හි වාර්ෂික එකතු කිරීම් සාවද්‍ය ලෙස තුලනය කර ඇති බව නිරීක්ෂණය විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු.596,856 ක ලැබිය යුතු සේවක ණය ශේෂ 22 ක්,සමාලෝචිත වර්ෂය අවසානයේ දී අයවීම අත්හිටවී තිබුණි.

(ආ) වර්ෂ 03 ක සිට 08 ක් දක්වා පැරණි රු. 29,450,645 ක ලංසු තැන්පතු , රැඳවුම් මුදල් හා ලංසු සුරක්ෂණ ඇප ශේෂ 64 ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2003 වර්ෂයට පෙර සිට පැවැත එන රු. 105,525 ක ණයගැති ශේෂයක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී හෝ පියවර ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නොගෙවූ වේතනවල වටිනාකම රු.174,860 ක් වූ අතර, එහි 2011 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. 103,377 ක වටිනාකමක්ද පැවතුණි.

(ඉ) 2012 මාර්තු 31 දින විශ්වවිද්‍යාලයේ පීඨයන් දෙකක ගොඩනැගිලි විවෘත කිරීම වෙනුවෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පළ කරන ලද ප්‍රචාරක දැන්වීම සඳහා රු.353,640 ක වියදමක් දරා ඇති අතර, මෙම ගෙවීම් ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) මඟින් අයකර ගැනීමට කටයුතු කරන ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ මාධ්‍ය ලේකම් දන්වා ඇති නමුත් , සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද අදාළ වියදම අයකරගෙන නොතිබුණි.

(ඊ) බුත්තල ව්‍යවහාරික විද්‍යාපීඨ පරිශ්‍රය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම් සභාව වෙත පවරා ගැනීමේ දී 2009 දෙසැම්බර් 31 දිනට රු. 4,699,075 ක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද තවදුරටත් ලැබිය යුතු ලෙස රු. 1,616,894 ක් පැවතුණි. වර්ෂ 05 ක් ගත වුවද මෙම මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 168 හා 200 | විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවයේ ඡායාරූපකරණයට අදාළව අත්සන් කරන ලද ගිවිසුමේ 08 වන වගන්තිය ප්‍රකාරව ගිවිසුම් ගත ආයතනයෙන් ලද රු.30,000 ක මුදල විශ්වවිද්‍යාල අරමුදලට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571(2) | 2008 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.342,500 ක ලංසු තැන්පතු 77 ක් හා 2005 වර්ෂයේ සිට පැවත එන රු.2,811,636 ක රඳවුම් මුදල් පොදු සංචිත ගිණුම මගින් කපා හැරීමට පියවර ගෙන ඇති නමුත්, ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදාල තැන්පතු හිමියන්ගෙන් හිමිකම් නොඉල්ලන බවට තහවුරු කිරීමක් කර නොතිබුණි. |
| (ආ) 2011 පෙබරවාරි 24 දිනැති අංක 449 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කාර්ය පැවරුම් පදනම මත වූ පත්වීම්, දින 45 ක් නොඉක්මවන හා පැවරුමකට ගෙවිය හැකි උපරිම මුදල රු.30,000 ක් වුව ද, ඊට පටහැනිව කාර්ය පැවරුම් පදනම මත පූර්ණ කාලීන නේවාසිකාගාර උප පාලක II ශ්‍රේණියේ තනතුර සඳහා මාසයකට රු.38,040 ක දීමනාවක් මත මාස 06 ක කාලයක් සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු පූර්ව අනුමැතියකින් තොරව පත්වීමක් ලබා දී තිබුණි. |
| (ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 3.6.1 වගන්තිය | සමාජ විද්‍යා හා භාෂා පීඨයේ දේශණ ශාලාවේ සහ ශ්‍රවණාගාරයේ ප්‍රයෝජනය සඳහා පුටු 1,050 ක අවශ්‍යතාවය සඳහා ලංසු කැඳවන අවස්ථාවේ දී අවශ්‍ය ප්‍රමාණය හඳුනාගෙන තිබියදී යොමුගත වගන්තියට පටහැනිව 2012 වර්ෂයේදී රු.5,286,120 ක් වැය කරමින් පුටු 700 හා 350 ක් වශයෙන් අවස්ථා දෙකකදී මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. |
| (ii) 9.3.1 (ආ) වගන්තිය | වටිනාකම රු. 200,000 ට වඩා වැඩි වාහන අළුත්වැඩියාව සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී වාහන තුනක් සඳහා එකතුව රු. 1,323,125 ක අළුත්වැඩියා වියදමක් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. |
| (iii) 2.14.1 වගන්තිය | සෘජු ගෙවීම් සිදු කළ හැක්කේ ඉතාමත් හදිසි අවස්ථාවල පමණක් වුවත්, ඊට පටහැනිව විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටියේ නඩත්තු කටයුතු සඳහා මිලගණන් කැඳවීමකින් තොරව මාස 03ක කාලයක් සඳහා රු. 825,000 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු. 208,466,511 ක පරිගණක සම්බන්ධයෙන් පරිගණක වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඉ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.59,919,196 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු.47,093,974 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,825,222 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයේ දායකය රු. 140,377,891කින් සහ අනෙකුත් ආදායම රු.6,303,274 කින් වැඩි වුවත්, පෞද්ගලික පාරිශ්‍රමික, ගිවිසුම්ගත සේවා, අනෙකුත් පුනරාවර්තන වියදම්, සැපයුම් හා පාරිභෝජන සහ නඩත්තු වියදම් ඉකුත් වර්ෂයට වඩා රු.117,119,956 කින් වැඩි වී තිබීම සහ බුත්තල ඉඩම් හා ගොඩනැගිලි පොත්වලින් ඉවත් කිරීමෙන් පැන නැගුන ඉවත් කිරීමේ අලාභය වූ රු. 43,446,162 ක් මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යයින් 3,424 දෙනෙකුගේ අධ්‍යාපනය වෙනුවෙන් දරන ලද පිරිවැය රු.1,045,290,171ක් වූ අතර, ඒක ශිෂ්‍ය පිරිවැය රු.305,283ක් විය .ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 3,359 දෙනෙකුගේ අධ්‍යයන පිරිවැය රු.724,914,540 ක් වූ අතර, ඒක ශිෂ්‍ය පිරිවැය රු.215,813ක් විය. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍ය සංඛ්‍යාව 65 දෙනෙකුගෙන් වැඩිවී තිබූ අතර, ඒක ශිෂ්‍ය පිරිවැය ද රු.89,470 කින් වර්ධනය වී තිබුණි

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී විෂයමාලා සංශෝධනය සඳහා රු.1,420,450 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණද, 2015 මැයි මස වන විටත් විෂයමාලා සංශෝධනය කර නොතිබූ අතරම ලබා ඇති ප්‍රගතියද වාර්තා කිරීමට අපොහොසත් විය.

(ආ) විශ්වවිද්‍යාලයේ පවිත්‍රතා සේවා සඳහා වූ රු.8,514,000 ක කොන්ත්‍රාත් කටයුතු බාහිර ආයතනයන් වෙත ලබාදීමේදී ලංසු ලියවිලිවල තාක්ෂණික දෝෂ ඇති බව සඳහන් කරමින් පිළිගත හැකි හේතුවකින් තොරව කොන්ත්‍රාත් කාලය මාස 06 කින් දීර්ඝ කර තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් ගනු ලබන තීරණයන්ගේ විනිවිදභාවය පිළිබඳ විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන වටිනාකම රු. 4,606,911 ක් වූ අරමුදල් 12 ක් වසර 2 ක සිට වසර 5 ක් දක්වා කාල පරාසය තුළ අක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

ට්‍රැක්ටර් ටේලර් 2 ක්, ෆයිබර් පුටු 25 ක් , ලීටර් 5,000 ක ප්‍රමාණයේ ප්ලාස්ටික් ටැංකි 02 ක් සහ ලීටර් 2,000 ක ප්‍රමාණයේ ටැංකි 03ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අනාරක්ෂිතව රථ ගාල පරිශ්‍රයෙහි රඳවා තිබුණි.

**4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

අමාත්‍ය මණ්ඩලය විසින් 2005 හා 2007 වර්ෂවලදී පිළිවෙලින් තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ලක් හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවත්, 2015 මැයි මස දක්වා එම ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ කර නොතිබුණු අතර, ඒ සඳහා උපදේශන ගාස්තු හා සමරු ඵලකය වෙනුවෙන් රු.3,337,508 ක් වැය කර තිබුණි.

**4.6 ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව කළමනාකරණ පීඨය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.760,767 ක් වැයකර වැසි ජලය ගලායන මාර්ගයක අක්‍රමවත්ව පානීය ජල ළිඳක් ඉදිකර තිබූ නමුත් එහි ජලය බීමට නුසුදුසු තත්ත්වයක පැවති බව දක්නට ලැබුණි.

(ආ) නව කාන්තා නේවාසිකාගාරය අසල රු.1,050,196 ක් වැය කර ඉදිකරන ලද වැඩ අවසන් නොකරන ලද නළ ළිඳක් මඟින් මිනිත්තුවකට ජල ලීටර් 135 ක් ලබා ගත හැකි බව දක්වා තිබුණත්, ලබා ගත හැකි ජල පරිමාව මිනිත්තුවකට ලීටර් 20 ක් විය. කෙසේ වෙතත් මේ දක්වා ළිඳ ප්‍රයෝජනයට ද ගෙන නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ පැවති එකලා විදුලි පද්ධතියට අනුකූල නොවූ රු.4,263,600 ක් වටිනා වායුසමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම හේතුවෙන්, පැවති එකලා විදුලි පද්ධතිය නවීකරණය කිරීමට රු.871,820 ක අමතර වියදමක් දැරීමට සිදුව තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 212 න් පුරප්පාඩු 06 ක් පැවති අතර, ඉන් මහාචාර්ය තනතුරු 03 ක් හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතිණි.

(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ vi වන කොටසේ 33 වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී තනතුර සඳහා බඳවාගැනීමට විශ්ව විද්‍යාලය අපොහොසත් වී තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත මාණ්ඩලික තනතුරු 31 ක් හා මාණ්ඩලික නොවන තනතුරු 495 ක් පැවති අතර එයින්

පිළිවෙලින් තනතුරු 07 ක් හා තනතුරු 58 ක පුරප්පාඩු පැවතිණි. එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය අසමත්ව තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල සීමාවට සකස් කළ සංයුක්ත සැලැසුමෙහි අන්තර්ගතව නොතිබුණි. එමෙන්ම, ඉටුකර ගත යුතු ඉලක්කයන්හි මූල්‍යමය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂිකව ප්‍රගතිය ඇගයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 134 (3) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවක මුදල් කටයුතුවලට අදාළ අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම පිටපත් ඉදිරිපත් කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

අයභාර වියදම් වෙනුවෙන් ඇස්තමේන්තු කළ සීමාවන් ඉක්මවා රු.64,125,390 ක් වැයකර තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 9 ක් විය. එමෙන්ම, ප්‍රාග්ධන වියදම් ලෙස අයවැය ලේඛනය මගින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 30 ක් හෙවත් රු. 119,797,619 ක් ඉතිරි වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

### 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

2014 ජූනි 05 වන දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පහත පරිදි විය.

(අ) 2007 වර්ෂයේදී පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද , 2015 මැයි මස දක්වා එම ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. එසේ වුවද මූලික වියදම් ලෙස රු.1,494,543 ක් වැය කිරීම සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල භූමිය තුළදී කෘෂි විද්‍යාපීඨයේ පීඨාධිපතිවරයාගේ පෞද්ගලික වාහනයට වූ හානිය වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ මුදලින් රු.60,000 ක මුදලක් ගෙවා තිබුණු අතර ,එකී මුදල නැවත පියවා ගැනීමට සහ ඒ සම්බන්ධව වගකිව යුතු නිළධාරීන් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කර නොතිබුණි.

**06. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපති වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) සේවක කළමනාකරණය

(ඇ) සංයුක්ත හා ක්‍රියාකාරී සැලැසුම්

(ඈ) තොග කළමනාකරණය

(ඉ) වියදම් කළමනාකරණය